# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ශ්‍රී ලංකා මුස්ලිම් කවුන්සලය
## (සංස්ථාගත කිරීමේ)

**ශ්‍රී ලංකා මුස්ලිම් කවුන්සලය සංස්ථාගත කිරීම**
**සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

ත්‍රිකුණාමල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා විසින්
2015 ඔක්තෝබර් මස 22 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2015 සැප්තැම්බර් මස 28 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[13 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 8.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

## ශ්‍රී ලංකා මුස්ලිම් කවුන්සලය (සංස්ථාගත කිරීමේ)

### ශ්‍රී ලංකා මුස්ලිම් කවුන්සලය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

පූර්විකාව.

ශ්‍රී ලංකා මුස්ලිම් කවුන්සලය වශයෙන් හඳුන්වනු ලබන සහ ප්‍රකාශ කරනු ලබන විවිධ කොටස් එකතුවීමෙන් සැදුම්ලත් දේශපාලන නොවන සංවිධානය මුස්ලිම් ජනවර්ගයාගේ සහ රටේ ගෞරවනීය නායක සර් රසික් ෆරීඩ්, ආචාර්ය බදියුඩීන් මොහොමඩ්, ආචාර්ය එම්.සී.එම්. කලීල්, ඒ. අසීස්, සර් ඒ. ඩබ්.එම්. අමීර්, එම්.එච්.එම්.අශ්රොෆ් සහ දැනට ජීවත්ව සිටින ප්‍රධාන නායකයන් විසින් 1983 දී පිහිටුවන ලද අතර, මුස්ලිම් සමාජයේ සමාජ, ආර්ථික, සංස්කෘතික, අධ්‍යාපන සහ දේශපාලන දියුණුව වර්ධනය කිරීමේ අරමුණින් සහ ශ්‍රී ලංකාවේ මුස්ලිම් සංවිධානයන්හි කටයුතු සම්බන්ධීකරණය කිරීමටත්, ජනතාව අතර, සාමය සහ සහයෝගීතාවය වැඩිදියුණු කර ගැනීම සඳහාත්, ජාතික එකගත්වය ළඟා කර ගැනීමටත්, සම්පත් ඒකාබද්ධ කිරීමට සහ යොමු කිරීමට කටයුතු කර ඇත.

එහෙයින් ඉහත සඳහන් සංවිධානය ඇති කිරීමට හේතු වූ අරමුණු සහ කාරණා සාර්ථකව ඉදිරියට ගෙන යන සහ ක්‍රියාවේ යොදවන ලද අතර, මහජනතාවගේ සුබසිද්ධිය උදෙසා ඉල්ලීමක් ප්‍රදානය කිරීමක් වශයෙන් සංවිධානය නීතිගත කිරීම සඳහා අදාළ කරනු ඇත :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2015 අංක   දරන ශ්‍රී ලංකා මුස්ලිම් කවුන්සලය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ආරම්භ කරන ලද දිනයේ සිට සහ ඉන්පසුව ශ්‍රී ලංකා මුස්ලිම් කවුන්සලයේ සාමාජිකයන් (මෙහි මින් මතු "කවුන්සලය" යනුවෙන් සඳහන් කරනු ලබන) සහ ඔවුන්ගේ උරුමකරුවන් මින් පසුව සකස් කරනු ලබන නියමයන් අනුව පත් කරනු හෝ තෝරා ගනු ලැබිය යුතු අතර, ඔවුන් මින් පසුව ශ්‍රී ලංකා මුස්ලිම් කවුන්සලය යන නාමය හා විලාශය යටතේ නිත්‍ය සාමාජිකත්වයෙන් යුතු සාමාජික මණ්ඩලයක් ලෙස (මින් පසුව "සංස්ථාව" ලෙස හැඳින්වෙන) සංස්ථාපිත වනු ඇති අතර, එමෙන් ම පොදු මුද්‍රාවක් තබා ගැනීමේ සහ භාවිතා කිරීමේ සහ තම අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද සම්පූර්ණ බලය හා අධිකාරීත්වය සහිතව සියලු අධිකරණයන්හි නඩු පැවරීමේ සහ පවරනු ලැබීමට මෙම නාමය යටතේ හැකියාව ඇත. සංස්ථාව සංස්ථාගත කිරීම.

2—PL 009248—300 (2015/09)

සංස්ථාවේ පොදු අරමුණු.

3. සංස්ථාව සංස්ථාගත කිරීමේ පොදු අරමුණු පහත ප්‍රකාශ කරන පරිදි වේ:—

(අ) රටේ විවිධ මුස්ලිම් සංවිධානයන්හි ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම;

(ආ) සියලුම ජනතාව අතර සාමය සහ මිත්‍රත්වය වැඩිදියුණු කිරීමේ අරමුණින් මුස්ලිම් සමූහයාගේ පවතින නිපුනතා සහ හැකියාවන් තහවුරු කිරීම;

(ඇ) සියලුම ජනතාව අතර, දේශීය එකමුතුකම හා වාර්ගික එකඟත්වය වැඩි දියුණු කිරීම;

(ඈ) සාමාන්‍ය වශයෙන් රටටත්, පොදුවේ සාමාජයටත් උපරිම යහපත සැපයීම;

(ඉ) ජීවිතයේ සියලුම අවස්ථාවලදී සමාජය මුහුණපාන ගැටලු අධ්‍යනය කිරීමට හා තක්සේරු කිරීමටත්, එම ගැටලුවලට සුදුසු විසඳුම් සෙවීම ;

(ඊ) ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන්ගේ හඬට අවස්ථාවක් සැපයීම සහ ජාතියක් වශයෙන් මුස්ලිම්වරුන්ගේ ස්වකීය නියෝජ්‍යත්වය තහවුරු කිරීම ;

(උ) මුස්ලිම් සමාජයේ සුභසාධන (යහපත) උදෙසා අවශ්‍ය වන වෙනත් ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට සහ ආරම්භ කිරීමට සියලුම මුස්ලිම් සංවිධානයන්ට සම්බන්ධීකරණ මධ්‍යස්ථානයක් වශයෙන් කටයුතු කිරීම.

සංස්ථාවේ බලතල.

4. මේ පනතේ සහ වෙනත් ඕනෑම ලිඛිත නීතියක නියෝගයන් යටතේ සංස්ථාවට ලැබෙන බලතල:—

(අ) සංස්ථාවේ අරමුණු උසස් කිරීමට හෝ වැඩිදියුණු කිරීමට අවශ්‍ය හෝ යෝග්‍ය ලෙස සියලුම එවැනි පනත්, කාරණා සහ වෙනත් ඕනෑම දෙයක් ආරම්භ කිරීමට සහ ඉටු කිරීමට;

(ආ) බැංකු ගිණුම්, ආරම්භ කිරීමට, පවත්වාගෙන යාමට හා වසා දැමීමට හෝ ආරක්ෂාවක් සහිතව හෝ රහිතව මුදල් රැස් කිරීමටත් හෝ ආපසු ගැනීමටත් ;

(ඇ) දේශීය හෝ විදේශීය මධ්‍යයන්ගෙන් ලැබෙන ආධාර සහ ත්‍යාග භාර ගැනීමට සහ රැස්කිරීමට ;

(ඇ) සංස්ථාව මගින් ලබාගත් හෝ අත්කරගත් හෝ හිමි වූ ඕනෑම ඉඩමක ඕනෑම ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා සංස්ථාවේ අරමුදල් ආයෝජනය කිරීමට;

(ඉ) සේවකයන් පත් කිරීමටත් සංස්ථාවේ අරමුණු මුදුන්පමුණුවා ගැනීමේ අවශ්‍යතාවක් ලෙසට නිලධාරීන් සේවයෙන් පහ කිරීමට හෝ සේවය අවසන් කිරීමට;

(ඊ) ඕනෑම පුද්ගලයෙක් හෝ පුද්ගල සමූහයක් සමග ගිවිසුම්වලට හෝ එකඟතාවයන්ට එළඹීමට;

(උ) සංස්ථාවේ පරමාර්ථ නිසිලෙස සහ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වෙනත් සියලු දේ කිරීම.

**5.** (1) සංස්ථාවේ කළමනාකරණය, පාලනය සහ පරිපාලනය මෙම පනතේ නියමයන් සහ පාලක මණ්ඩලයෙන් පත්වන සංස්ථාව මගින් කලානුරූපීව බලපවත්වනු ලබන රීති වලට අනුකූල විය යුතු අතර, මෙම පාලක මණ්ඩලය (මින්මතු "පාලක මණ්ඩලය" යනුවෙන් හඳුන්වනු ලබන) නිළධාරී මණ්ඩලයෙන් සහ එබඳු රීතිවලින් සපයනු ලැබිය හැකි සහ එම රීති අනුව පත් කරනු ලබන වෙනත් නිළධාරීන්ගෙන් සමන්විත වෙයි. සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

(2) මෙම පනතේ උපලේඛනයේ නම්වලින් පෙනී සිටින්නා වූ කවුන්සලයේ සමාජිකයන් සංස්ථාවේ පළමු පාලක මණ්ඩලය බවට පත් විය යුතු වේ.

(3) පාලක මණ්ඩලයේ කිසියම් සාමාජිකයකුගේ මරණය, ඉල්ලා අස්වීම හෝ සාමාජිකත්වය අවසන් වීම මත උද්ගත වන කිසියම් පුරප්පාඩුවක් සංස්ථාවේ රීතිවලට යටත්ව සම්පූර්ණ කළ හැකි අතර, සංස්ථාවේ කිසියම් සුදුසු සාමාජිකයෙක් තුනෙන් දෙකේ බහුතර ඡන්දයෙන් පාලක මණ්ඩලයට පත් කිරීම මණ්ඩලයට නිත්‍යානුකූල වේ.

(4) පාලක මණ්ඩලය මගින් නිළධාරි මණ්ඩලය වන සභාපති, උපසභාපති, කළමනාකාර අධ්‍යක්ෂ, සහකාර කළමනාකාර අධ්‍යක්ෂ භාණ්ඩාගාරික, සහකාර භාණ්ඩාගාරික පත් කරනු ලැබිය යුතු ය.

**6.** (අ) පාලක මණ්ඩලයේ තීරණ මත සහ කරනු ලබන ආරාධනාවෙන් සාමාජිකත්වය තීරණය විය යුතු ය. සාමාජිකයින් ලියාපදිංචි කිරීම.

(ආ) මරණය හෝ ඉල්ලා අස්වීම හෝ කවුන්සලයේ තීරණය මත සමාජිකත්වය අවසන් විය හැක.

*සංස්ථාවේ රීති.*

7. (1) මෙම පනතේ අරමුණු ඉටු කිරීමටත් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සඳහාත් මෙම පනතේ හෝ වෙනත් ලිඛිත නීතියක නියෝග සමග නොගැලපෙන නොවන ලෙසට නීති සකස් කිරීමට කාලයෙන් කාලයට නිර්දේශ කිරීමටත්, පැමිණ සිටින සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන් සාමාජිකයන්ගෙන් පොදු රැස්වීමක දී සංස්ථාව මගින් අනුමත කිරීමටත්, ඡන්දය දීමටත්, පාලක මණ්ඩලයට නීත්‍යානුකූල වේ. එවැනි රැස්වීමකදී ඒ ආකාරයෙන් සකස් කරනු ලබන රීති වෙනස් කිරීම, එකතු කිරීම, සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම කළ හැක.

(2) මෙම පනත ආරම්භ කරන ලද දිනයේ පටන් වහාම සභාවේ රීති බලපැවැත්වෙන අතර, වෙනත් කිසියම් ලිඛිත හෝ මෙම පනතේ ප්‍රතිපාදනයන් සමග ගැලපෙන තාක් දුරට මෙම වගන්තිය යටතේ පනවනු ලබන රීති සංස්ථාවේ රීති බවට පත් විය යුතු ය.

(3) මෙම කවුන්සලයේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

*කවුන්සලය මගින් ගෙවිය යුතු සහ ලැබිය යුතු ණය.*

8. මෙම පනත ආරම්භක දිනයට කලින් ඇති වූ කවුන්සලයේ සියලු ණය සහ වගකීම් සංස්ථාව මගින් ගෙවිය යුතු අතර, යම් දිනක දී කවුන්සලයට ගෙවිය යුතු දායක මුදල් සහ සාමාජික මුදල් සහ ණය මෙම පනතේ අරමුණු උදෙසා සංස්ථාවට ගෙවිය යුතු වෙයි.

*සංස්ථාවේ දේපළ.*

9. සංස්ථාව එහි රීතිවලට යටත් විය යුතු අතර, කිසියම් මිලදී ගැනීමකින්, ප්‍රදානයකින්, ත්‍යාගයකින්, බූදල් පවරාදීමකින් හෝ වෙනත් යම් ක්‍රමයකින් අත් කර ගනු ලබන කිසියම් චංචල හෝ නිශ්චල දේපළක් නීතියට අනුව ලබා ගැනීමට සහ දරා සිටීමට හැකියාව සහ සුදුසුකම් සංස්ථාවට පවත්නා අතර, සියලුම දේපළ මෙම පනතේ අරමුණු උදෙසා විකිණීම, උකස් කිරීම, බදු දීම, හුවමාරු කිරීම, හෝ එවැනි ආකාරයේ නිදහස් කිරීමකට සම්පූර්ණ බලය සහිතව සංස්ථාවේ වලංගු නීතිවලට යටත්ව සංස්ථාව මගින් දරා සිටිය යුතු ය.

*සංස්ථාවේ අරමුදල.*

10. සංස්ථාවට තමාගේම අරමුදලක් පැවතිය යුතු අතර, ත්‍යාගයකින්, උරුමයෙන්, පරිත්‍යාගයකින්, දායක මුදලකින්, ආධාර මුදලකින් හෝ ප්‍රදානයකින් හෝ සහ සංස්ථාවේ ගිණුමකින් මින් පෙර හෝ පසුව ලැබෙන සියලුම මුදල් සංස්ථාව විසින් නියම

කරගත යුතු වන එක් බැංකුවක හෝ බැංකු කීපයක තැන්පත් කළ යුතු ය.

*ගිණුම් සහ පරීක්ෂණ*

11. (1) සංස්ථාව මගින් ලබා ගනු ලබන සහ වියදම් කරනු ලබන සියලුම මුදල් තබා ගැනීම උදෙසා සුදුසු ගිණුම් සංස්ථාව මගින් ඇති කළ යුතු ය.

(2) අවම වශයෙන් සෑම අවුරුද්දකට එක් වරක්වත් සංස්ථාව සතු ගිණුම් විමර්ශනයට සහ පරීක්ෂාවට ලක් කිරීම කළ යුතු වන අතර, සංස්ථාව මගින් පත් කරනු ලැබූ ශ්‍රී ලංකා ගණකාධිකාරී ආයතනය හා සම්බන්ධ සාමාජිකයෙක් වන්නා වූ පරීක්ෂකයෙක් හෝ පරීක්ෂකවරුන් මගින් ආදායම් සහ වියදම් ගිණුම්වල සහ අයවැය ලේඛනයේ නිරවද්‍යභාවය සහතික කළ යුතු වෙයි.

*කමිටු පත් කිරීම.*

12. සාමාජිකයන් අතර විනය සහ වෘත්තීමය තත්ත්වය පවත්වාගෙන යාම සඳහා විටින් විට අවශ්‍යවිය හැකි වෙනත් එවැනි පියවර ගැනීමටත් පාලක මණ්ඩලයට බලය තිබිය යුතු ය.

*සංස්ථාවේ මුද්‍රාව.*

13. සංස්ථාවේ රීතීන්හි සඳහන් කරනු ලැබිය හැකි ආකාරයට පුද්ගලයන් කීපදෙනකු ඉදිරියේ මිස, සංස්ථාවේ මුද්‍රාව කුමක් හෝ ඕනෑම නීත්‍යානුකූල ලේඛනයක් මත නොතැබිය යුතු අතර, ඔවුන් ඉදිරියේ මිස අත්සන් සාක්ෂියක් ලෙසට ස්වාධීන විය යුතු ය.

*ජනරජයේ අනෙකුත් පුරවැසියන්ගේ අයිතීන් ආරක්ෂා කිරීම.*

14. මෙම පනතේ සඳහන් කරුණු සහ ඔවුන් විසින්, ඔවුන් මගින් හෝ ඔවුන් යටතේ ඉල්ලනු ලබන කරුණු හැර ආණ්ඩුවේ හෝ වෙනත් ආණ්ඩුවේ යටත් වැසියන්ට හෝ සංස්ථාවකට හෝ වෙනත් කිසියම් පුද්ගල අයිතිවාසිකම්වලට පක්ෂපාත වන හෝ බලපානු ලැබිය හැකි කිසිදු දෙයක් මෙම පනතේ අන්තර්ගත නොවේ.

*අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.*

15. මෙම පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨයන් අතර, යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## උපලේඛනය

### පාලක මණ්ඩලය

අල්හාජ් ඒ.එච්.ජී. අමීන්, එල්.එල්.බී. එල්.එල්.එම්. ජේ.පී.යූ.එම්.
අල්හාජ් ඒ.සී.එම්. ෂෆීක්, ජේ.ජී.බී.එස්.එෆ්.අයි.එම්.අයි.එම්.අයි.ආර්.ටී.ඊ(බ්‍රිතාන්‍ය)
සී.ඒ.ඊ.එෆ්.අයි.ඒ.ඊ. (ශ්‍රී ලංකාව)
අල්හාජ් හබ්බුල්ලා
ආචාර්ය හමීඩ් මොහොමඩ් මව්රූෆ් එම්.බී.බී.එස්.
ආචාර්ය මොහොමඩ් අනීස්
අල්හාජ් එම්.ඩී.එම්.වසීර්, ජේ.පී.
එම්.එච්.එම්.නියාස් මහතා

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.